## කොටස් තැරැව්කාර ආයතන පිළිබඳ විශ්වාසනීයත්වය ඉහළ නංවා ගැනීම.

කිසියම් ආයෝජකයෙකුට තම කොටස් තැරැව්කාර ආයතනය පිළිබඳව විශ්වාසනීයත්වය ඉහළ නංවා ගැනීමට සළකා බැලිය හැකි කරුණු කිහිපයක් තිබේ. ඉන් එක් කාරණාවක් ලෙස කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොටස් තැරැව්කාර සමාගම්වල මූල්‍ය තත්ත්වය පිළිබඳව සොයා බැලීමක් සිදු කිරීම පෙන්වා දිය හැකිය. උදාහරණයක් වශයෙන් ගත් විට කොටස් තැරැව්කාර ආයතනයක් සාමාජික රෙගුලාසි මගින් නියම කර ඇති පරිදි රුපියල් මිලියන 35ක අවම ප්‍රමාණවත් ද්‍රවශීලප්‍රාග්ධනයක් පවත්වාගෙන යා යුතුය.

ආයෝජකයාට අවශ්‍ය අවස්ථාවලදී කොටස් තැරැව්කාර ආයතනය හා සම්බන්ධ වීමට හැකියාව ඇත්නම්, ආයෝජකයාට අවශ්‍ය පරිදි උපදෙස් ලබා ගැනීමට හැකිනම් සහ ආයෝජකයාගේ ප්‍රතිලාභ ඉහළ නංවා ගැනීමට හැකි පරිදි කොටස් තැරැව්කාර ආයතනය කටයුතු කරන්නේ නම් එය ද විශ්වාසනීයත්වය තහවුරු කර ගැනීමට හේතු වේ.

තැරැව්කාර ආයතනයක් කටයුතු කරන ආකාරය, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුවේ නිරන්තර අධීක්ෂණයට ලක් කිරීම තුළින්ද ආයෝජනයේ නිරත පුද්ගලයින්ට කොටස් වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳ විශ්වාසය ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබේ.

මේ අනුව සාර්ථක ආයෝජන කළඹක් පවත්වාගෙන යාමේදී ආයෝජකයෙකුට මෙම කරුණු සියල්ලම වැදගත් වන බව කිව හැකිය. එමෙන්ම දැනුවත් ආයෝජන තීරණ ගැනීම යන කාරණාවට මේ සියළු කරුණු ඇතුලත් වේ. කොටස් වෙළෙඳපොළ ඇතුළුව සමස්ත ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ගනුදෙනු කරන ආයෝජකයන්, තමන් ගනුදෙනු කරන කොටස් තැරැව්කාර සමාගම, එහි ආයෝජන උපදේශකවරයන් පිළිබඳව මෙන්ම එම ආයතනය සහ පුද්ගලයන් පිළිබඳ යම් මට්ටමක හෝ දැනුවත්වීමක් සහිතව ආයෝජනය කිරීම සෑම අතින්ම වැදගත් වේ.




SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA


**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**
28 සහ 29 වන මහළ, නැගෙනහිර කුළුණ.
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, එච්ලන් චතුරශ්‍රය
කොළඹ 01.
දුරකථන : +94 11 2143843
ෆැක්ස් : +94 11 2439149
ඊ-මේල් : mail@sec.gov.lk
වෙබ් අඩවිය: www.sec.gov.lk


# ආයෝජකයා, ආයෝජන උපදේශකවරයා සහ කොටස් තැරැව්කාර සමාගම




## ඔබ කොටස් වෙළෙඳපොළ ආයෝජකයකු නම්,

අනාගතයේ යම් ප්‍රතිලාභයක් ලැබීමේ චේතනාව ඇතිව තමන් මහන්සියෙන් උපයාගත් ධනයෙන් යම් ප්‍රතිශතයක් කිසියම් වත්කමක ආයෝජනය කිරීම ආයෝජකයකුගේ අරමුණයි. ආයෝජකයකු තම මුදල් එවැනි කටයුතු සඳහා වෙන් කිරීමේ දී තමන් ගණුදෙනු කරනු ලබන ආයතනය පිළිබදව ඉතා හොඳින් සොයා බලා ගනුදෙනු ආරම්භ කිරීම සහ ගනුදෙනු ආරම්භ කර ඉදිරියට යාමේදී විමසිලිමත්ව ආයෝජනයෙහි නිරතවීම ඉතා වැදගත් වේ. ඒ අනුව ගත් විට කොටස් වෙළෙඳපොළ ආයෝජනයේදී ද ආයෝජකයෙකුට මුලින්ම මුණ ගැසෙන ආයතනය වනුයේ කොටස් තැරැව්කාර සමාගමයි. එමෙන්ම එහි ගණුදෙනු සඳහා ආයෝජකයාට පහසුකම් සලසනු ලබන්නේ කොටස් තැරැව්කාර සමාගමේ සිටින ලියාපදිංචි ආයෝජන උපදේශකවරයන්ය. මේ අනුව ආයෝජකයකු ආයෝජන උපදේශකවරයා සහ කොටස් තැරැව්කාර ආයතනය සපයනු ලබන සේවාවන් මොනවාද යන්න සොයා බැලීමක් කරනවා සේම ආයෝජන උපදේශකවරයා කුමන ආකාරයේ පුද්ගලයෙක්ද ඔහු අදාළ සුදුසුකම් සපුරා ඇත්ද සහ කොටස් තැරැව්කාර ආයතනයේ ස්වභාවය, එහි පැවැත්ම, ආදී කරුණු පිළිබඳවත් සොයා බැලීමක් කළ යුතුය.

## කොටස් තැරැව්කාර ආයතනය පිළිබඳව ඔබ කොතරම් දැනුවත්ද?

ඔබගේ කොටස් වෙළෙඳපොළ ආයෝජන ගමන් මගේදී කොටස් තැරැව්කාර ආයතනය විසින් සපයනු ලබන්නේ ප්‍රබල කාර්යයකි. එමෙන්ම ආයෝජන තීරණ ගැනීමේදී කොටස් තැරැව්කාර ආයතනයක් මගින් අවශ්‍ය සියළු විස්තර අසා දැනගැනීම තුළින් සමහර අවස්ථාවල ඔබට අනාගතයේදී මුහුණ දීමට සිදු විය හැකි විවිධ ගැටළු වලින් ආරක්ෂා වීමට උපකාරී වේ. කොටස් තැරැව්කාර ආයතනයක් සමඟ ගණුදෙනු කිරීමේදී ආයෝජකයකු වශයෙන් අවධානය යොමු කළ යුතු සහ හොඳින් දැනුවත්ව සිටිය යුතු වැදගත් කරුණු රාශියක් දැකගත හැකිය. කොළඹ කොටස් හුවමාරුව යටතේ ලියාපදිංචි සියළුම කොටස් තැරැව්කාර සමාගම් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා තිබිය යුතුය. කොටස් තැරැව්කාර සමාගම් 29ක් සඳහා වර්තමානය වන විට බලපත්‍ර ලබා දී ඇති අතර සියළු කොටස් තැරැව්කාර සමාගම් පිළිබඳ වැඩිදුර තොරතුරු එම සමාග ම්වල වෙබ් අඩවි තුළින් ලබාගත හැකිය. කොටස් තැරැව්කාර ආයතනයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත්තේ කොහේද, එහි ශාඛා කාර්යාල ක්‍රියාත්මක වන්නේද, යනාදී කරුණු පිළිබඳව ද බුද්ධිමත්ව ආයෝජනය කරන්නෙකු අවධානය යොමු කිරීම ප්‍රයෝජනවත්ය.

## ලියාපදිංචි ආයෝජන උපදේශකවරයකුගේ කාර්යභාරය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මෙහෙයවනු ලබන ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාව (CCM) සමත්ව අනතුරුව විද්වත් මණ්ඩලයක් ඉදිරියේ පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් සමත්ව ලබා ගන්නා ලියාපදිංචි ආයෝජන උපදේශක තනතුර (RIA) ලබා ඇති වෘත්තීයමය සුදුසුකම් සපුරා ඇති තැනැත්තන් ආයෝජන උපදේශකවරුන් ලෙස හඳුන්වනු ලබයි.

කොටස් වෙළෙඳපොළ ආයෝජනයේදී ආයෝජකයෙකු වෙනුවෙන් සී ඩී එස් ගිණුම් විවෘත කිරීම, කොටස් මිලදී ගැනීම සහ විකිණීම මෙන්ම අවශ්‍ය ආයෝජන උපදෙස් ලබාදීම ඇතුළු කාර්යන්වලදී පුළුල් සේවාවක් සපයනු ලබන්නේ ඉහතින් සඳහන් කළ කොටස් තැරැව්කාර සමාගමක සිටින ලියාපදිංචි ආයෝජන උපදේශකවරුන්ය. ආයෝජන උපදේශකවරුයෙකු තම ගනුදෙනුකරුවන් ලබාදෙන ගැනුම් ඇණවුම් හා විකුණුම් ඇණවුම් නිවැරදිව ක්‍රියාත්මක කිරීමට හා ආයෝජකයින්ට අවශ්‍ය ආයෝජන උපදෙස් නිවැරදිව ලබාදීමට කටයුතු කළ යුතුය.

## කොටස් තැරැව්කාර ආයතනයක් තෝරා ගැනීමට පෙර,

එම ආයතනය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ කොළඹ කොටස් හුවමාරුවේ නීති රීති සහ විධාන වලට අනුකූලව කටයුතු කර ඇත්දැයි විමසා බැලිය යුතු වේ. උදාහරණයක් ලෙස කොටස් තැරැව්කාර ආයතනයක් අවම ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වාගෙන නොගියොත් එම කොටස් තැරැව්කාර ආයතනයේ ගනුදෙනු අත්හිටුවීම දැක්විය හැකිය. එවැනි තොරතුරු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ කොළඹ කොටස් හුවමාරුවේ වෙබ් අඩවිය තුළින්ද දැකගත හැකි වේ.



## ආයෝජනයන් සඳහා ගනුදෙනුකරුවන්ගෙන් ලැබෙන මුදල් පවත්වා ගැනීම විශ්වාසවන්තව සිදු කළ යුතුය.

ආයෝජකයන් විසින් කොටස් මිලදී ගැනීම සඳහා ලබාදෙන මුදල් තැන්පත් කිරීමට කොටස් තැරැව්කාර ආයතනයක් විසින් වාණිජ බැංකුවක වෙනම ගිණුමක් පවත්වාගෙන යයි. එසේ ආයෝජකයන් විසින් කොටස් තැරැව්කාර ආයතනයක් වෙත ලබාදෙන මුදල් ඉතා විශ්වාසවන්ත අයුරින් පවත්වා ගැනීමට කොටස් තැරැව්කාර ආයතනය සමත් විය යුතුය. කිසිම අවස්ථාවක කොටස් තැරැව්කාර ආයතනයට එම අරමුදල් තම ප්‍රයෝජනය සඳහා හෝ එහි ණය මුදලක් පියවීම වැනි කාර්යයන් සඳහා යොදා ගත නොහැක. ආයෝජකයකු කොටස් මිලදී ගැනීමක් වෙනුවෙන් මුදල් යොමු කරනු ලබන්නේ එම බැංකු ගිණුමට වන අතර එය ඔන්ලයින් හරහා පැවරීමට බොහෝ ආයෝජකයන් වර්තමානයේදී පෙළඹී ඇත. ආයෝජකයෙකුට අවශ්‍ය නම් කොටස් තැරැව්කාර සමාගමේ බැංකු ගිණුමට මුදල් තැන්පත් කර ඊට අදාළ රිසිට් පතෙහි ඡායා පිටපතක් ඊමේල් මගින් හෝ වට්ස් ඇප් මගින් එවීමට ද හැකියාව ඇත.




## ආයෝජකයන් වෙතින් ලැබෙන මුදල් ආයෝජනය කිරීම

තැරැව්කාර ආයතනයකට ආයෝජකයන් වෙතින් ලැබෙන මුදල් ආයෝජකයාගේ කැමැත්ත අනුව ඔහු යෝජනා කරන සුරැකුම්පත් මිලදී ගැනීම වෙනුවෙන් වැය කළ හැකිය. ඒ අනුව කොටස්, සමාගම් ණයකර, ආදී සුරැකුම්පත් මිලදී ගැනීම සඳහා එම මුදල් යෙදවිය හැකිය. ආයෝජකයකු කොටස් මිලදී ගන්නේ නම් අදාළ සමාගම, කොටස් ප්‍රමාණය සහ කොටසක මිල ආදිය ආයෝජන උපදේශකවරයන් වෙත ලබා දිය යුතු වේ. එය මිලදී ගැනීමේ ඇණවුමක් ලෙසද හඳුන්වයි. එසේ මිලදී ගැනීමක් සිදු කළේ නම්, ඒ සඳහා ගැනුම් සටහනක් ද ආයෝජකයා වෙත ලබා දී එම මිලදී ගැනීම් වලට අදාළ විස්තර තම කොටස් තැරැව්කාර ආයතනය තුළ නිවැරදිව පවත්වාගෙන යාමද වැදගත් වේ. යම් අවස්ථාවක අවශ්‍ය වුවහොත් එවැනි ගනුදෙනු විස්තර කොටස් තැරැව්කාර සමාගම ඉදිරිපත් කිරීමට බැඳී සිටී.



## තොරතුරු වාර්තාකරණ ක්‍රමයක් පවත්වා ගැනීම

ගනුදෙනු කරුවන් සිදුකරන ගනුදෙනු ක්‍රියාකාරකම් පිළිබඳව තොරතුරු වාර්තා කිරීමේ ක්‍රමයක් පවත්වා ගැනීම කොටස් තැරැව්කාර සමාගමක තවත් වගකීමකි. විශේෂයෙන්ම කොටස් මිලදී ගැනීම සඳහා වන ගැනුම් සටහන් මෙන්ම, කොටස් විකිණීම සඳහා වන විකුණුම් සටහන් ආදිය ගනුදෙනු ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු වලට ඇතුළත් වේ. ගණුදෙනු හා සම්බන්ධ තොරතුරු නිසි ලෙස පවත්වා ගැනීම තුළින් ආයෝජකයින් විසින් සමාගම් වෙත ගෙවීමට ඇති හිඟයන් පිළිබඳව දැනගැනීමටත්, ගනුදෙනුවක් හා සම්බන්ධ ආයෝජකයකුගෙන් යම් පැමිණිල්ලක් ලැබුණහොත් ඒ පිළිබඳව සොයා බලා එය නිවැරදි කර ගැනීමටත් හැකියාව ලැබේ. මේ අනුව නිසි තොරතුරු වාර්තාකරණ ක්‍රමයක් පවත්වා ගැනීම තුළින් කොටස් ගනුදෙනු වලදී මුහුණදීමට සිදුවන ගැටළුකාරී තත්ත්වයන් අවම කර ගැනීමට මෙන්ම ආයෝජක විශ්වසනීයත්වය ඉහළ නංවා ගැනීමටද හැකියාව ලැබේ.

## ස්වයංක්‍රීය වෙළෙඳ ක්‍රමය හා ඇණවුම් ගැළපීම

සමහර ආයෝජකයන්ට කොටස් මිලදී ගැනීම සඳහා ආයෝජන උපදේශකවරයා හරහා ඇණවුමක් භාරදීමෙන් පසු කුමක් සිදු වන්නේද යන්න පිළිබඳව නිසි අවබෝධයක් නොමැත. වර්තමානයේදී කොළඹ කොටස් හුවමාරුව තුළ කොටස් ගනුදෙනු සිදු වන්නේ ස්වයංක්‍රීය වෙළෙඳ ක්‍රමය (Automated Trading System -ATS) නැමති විද්‍යුත් ගනුදෙනු ක්‍රමය හරහාය. එසේම ඇණවුම් ගැලපීම සිදුවනුයේ මිල කාල ප්‍රමුඛතාව (Price Time Priority) නැමති කොන්දේසිය යටතේය. ඒ අනුව යම් ගැනුම් ඇණවුමකට සමාන විකුණුම් ඇණවුමක් ස්වයංක්‍රීය වෙළෙඳ ක්‍රමය වෙත ලැබුණ විගස එම ඇණවුම් එකිනෙක ගැළපෙන අතර එය සාර්ථක ගනුදෙනුවක් ලෙස පෙන්වා දිය හැකිය.

## දිවයිනේ ඕනෑම තැනක සිට ගනුදෙනු කිරීමේ හැකියාව

කොළඹ කොටස් හුවමාරුවේ ස්වයංක්‍රීය වෙළෙඳ ක්‍රමය හරහා එහි සියළු සාමාජික කොටස් තැරැව්කාර සමාගම් සමඟ දිවයිනේ ඕනෑම තැනක සිට ගනුදෙනු කිරීමේ හැකියාව ලැබී තිබේ. කොළඹින් බැහැර අයෙකුට වුවද කොටස් වෙළෙඳපොළ සමඟ පහසුවෙන් ගනුදෙනු කිරීමේ හැකියාව ලැබී ඇත්තේ විද්‍යුත් ගනුදෙනු ක්‍රමය හේතුවෙනි. ඒ අනුව, මාතර, මහනුවර, කුරුණෑගල, මීගමුව, යාපනය අනුරාධපුර, රත්නපුර, සහ අම්බලන්තොට යන නගරවල ස්ථාපිතව ඇති කොටස් වෙළෙඳපොළ ශාඛා වලින් සහ ඒ අශ්‍රිතව ඇති කොටස් තැරැව්කාර සමාගම් වලින් දිවයිනේ ඕනෑම තැනක ජීවත්වන පුද්ගලයෙකුට කොටස් වෙළෙඳපොළ තොරතුරු ලබා ගැනීමට හැකියාව ලැබී තිබේ.

කොටස් තැරැව්කාර ආයතනය සමඟ සම්බන්ධ වෙමින් ගණුදෙනු කිරීමට අමතරව ඔබට අවශ්‍ය නම් අන්තර්ජාල ගිණුමක් පවත්වාගෙන යාමට කොටස් තැරැව්කාර සමාගමෙන් ඉල්ලීමක් කළ හැකි අතර එමගින් ගැනුම් ඇණවුම් හා විකුණුම් ඇණවුම් ක්‍රියාත්මක කරමින් ආයෝජකයාටම ඔහුගේ ගිණුම හසුරුවා ගැනීමට හැකියාව ලැබේ. කෙසේ වෙතත් මෙහිදී ඔබ මතක තබා ගතයුතු තවත් වැදගත් කරුණක් වන්නේ ඔබ අන්තර්ජාලය ගිණුමක් හරහා ගනුදෙනු සිදුකළත් එය සිදු කළ යුත්තේ කොටස් තැරව්කාර ආයතනයක් හරහා බවයි. දිවයිනේ ඕනෑම තැනක සිට කොටස් මිලදී ගැනීම සහ කොටස් විකිණීම සඳහා ආයෝජකයින් ලබා දෙන ඇණවුම් නිවැරදිව පරිගණකයට ඇතුලත් කිරීමට ආයෝජන උපදේශකයින් සැලකිලිමත් විය යුතු අතර, ආයෝජකයන්ද නිවැරදිව තම ඇණවුම් විස්තර ලබා දීමට කටයුතු කළ යුතුය.

## අනුකූලතා නිළධාරී සහ ගනුදෙනුකරුවන්ගේ ආයෝජන

කොටස් ගනුදෙනුවලදී ආයෝජකයා තම සියලුම ගණුදෙනු කටයුතු ආයෝජන උපදේශකවරයා සමඟ කළ යුතු වේ. එමෙන්ම කොටස් තැරව්කාර ආයතනයක සිටින අනුකූලතා නිලධාරී වරයා (Compliance Officer) කවුරුන්ද යන්න ආයෝජකයකු අනිවාර්යයෙන් දැන සිටිය යුතුය. ඔහුගේ ප්‍රධාන කාර්යය වනුයේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව , කොළඹ කොටස් වෙළෙඳපොළ, මධ්‍යම තැන්පතු ක්‍රමය ආදී ආයතනවල නීති රීති අනුව කොටස් ගනුදෙනු සිදුවෙනවාද යන්න පිළිබඳව සහතික වීමයි.

එසේම අනුකූලතා නිලධාරීවරයා ගනුදෙනු මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ස්වාධීන විය යුතුය. ඒ අනුව කොටස් ගනුදෙනුවක් හා සම්බන්ධව ආයෝජකයකු හා ආයෝජන උපදේශකවරයා හෝ කොටස් තැරැව්කාර සමාගමේ වෙනත් නිලධාරීවරයෙක් සමඟ ගැටළුවක් මතු වු විට ඒ සම්බන්ධ පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය නම් ලිඛිතව මාස තුනක් ඇතුළත අනුකූලතා නිලධාරීවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ පැමිණිල්ලක් ලැබුණු පසුව ඊට නිසි සෑහිමකට පත්විය හැකි විසඳුමක් ලබා දීම අනුකූලතා නිලධාරීවරයකුගෙන් බලාපොරොත්තු වේ.